
# අපේ දූ දරුවන්ට සරු භූමියක් ඉතිරිකර යමු

(කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පස් සංරක්ෂණ නිලධාරි,
ජේ. එස්. ගුණසේකර මහතා පස සහ ජලය සංරක්ෂණය
යන මැයෙන් ලියන ලිපි පෙළක පළමු වැන්නයි මේ)

මහ පොළොවේ ජීවීන් ගේ පැවැත්මට ජලය අත්‍යවශ්‍යය. ජලයෙන් තොර වූව හොත් එය වඳ භූමියක් වනවා නොඅනුමානය. ජනතාවට එහි ඇති වටිනාකම පුන පුනා කීමක් අවශ්‍යව නැත්තේ ඇත්ත වශයෙන් ම එයින් තොරව ජීවිතයේ පැවැත්මක් නොවන නිසාය. පිළිසිඳ ගැනීමේ සිට උත්පත්තිය දක්වා ද, එහි සිට මරණය දක්වා ද මිනිස් යන්ත්‍රයේ වැදගත් කාර්යාවලියක් එමඟින් ඉටු කරවන අතර, නූතන සමාජයීය ජීවිතය සකසන හැම කටයුත්තකම එහි අත්‍යවශ්‍ය බව කැපී පෙනෙනවා. බොහෝ විට සැපයුම අතින් මඳ වුවත්, ඇත්ත වශයෙන් ම ජලයෙහි ඇති අවසන් කළ නොහැකි, ඒ වගේ ම නැවත පළමුව තිබූ තත්වයට ම ගෙන ඒමට හැකි සම්පතක ගති ස්වභාවය මෙහිලා සඳහන් කළයුතු විශේෂ කරුණක්. මනුෂ්‍ය ජීවිතයට ප්‍රමාණවත් තරම් ජලය තිබුණත්, පාවිච්චියට යොදගත හැකි තරමේ තත්වයකින් අවශ්‍ය ප්‍රමාණයට ලබා ගැනීමටත්, නියම ස්ථානයේ නියම වේලාවට එය එසේ ලබා ගැනීමටත් නොතිබීම, බොහෝවිට ගැටළුවක් ව පවතිනවා.



සෝද පාළුවෙන් පස රකින්නට අවසානය දක්වා සටන් කරන තනිවූ සෙබලෙක්

ගෘහ, කෘෂිකාර්මික හා කාර්මික කටයුතු වල අවශ්‍යතා එමඟින් ඉටු කරයි. එය පවිත්‍ර කෙරෙන හා කසල බැහැර කරන කාරකයක් ද වේ. බීමට සහ වෙනත් ගෘහ අවශ්‍යතාවලටත්, බෝග හා පැලෑටිවල වැඩීමටත්, ජලයේ ජීවත් වන ජීවීන් ගේ පැවැත්මටත් එය අත්‍යවශ්‍යය. ඒ වගේ ම එය බල ශක්ති මහක් වන අතර, ප්‍රවාහන කාර්යයන් සඳහා ද මාධ්‍යයක් වේ. ජලය භාවිතා කරන විවිධාකාර මාර්ග වීම හේතුකොට ගෙන උවමනාවන් අතර ගැටීමක් ඇති වී තිබීම නිසා ප්‍රශ්නද උද්ගත වී තිබේ.

මේ අවශ්‍යතා ඉටු කර ගැන්මට මිනිසා සිය විචක්ෂණ භාවය හා ධෛර්යවන්තකම මගින් නිර්මාණය කළ ඉදි කිරීම් ද සහ ජලය රැගෙන යන මාර්ග ද තැනීමට අනාදිමත් කාලයක සිට නිරත වී ඇත. ආදී කාලයේ සිට මිනිසාට අඩු, අවිනිශ්චිත හෝ සෘතුමය වර්ෂාපතනයක් ඇති ප්‍රදේශයන්හි පදිංචි වීමට සිදු වූ හෝ පදිංචි වීමට ගිය අවස්ථා එමට ය. මේ අභියෝගවලට මුහුණ

දුන් ඔහු ජලය ඔහුගේ ප්‍රයෝජනයට නතු කර ගැනීමට ඇති හැකියාව දියුණු කර ගැනීමත් සමඟ ජනාවාස ප්‍රදේශ පුළුල් කිරීමට ඔහුට හැකි විය. මිනිසා ගේ පරිනාමය, සංවර්ධනය හා ප්‍රගතිය ඇත්තවශයෙන් ම ජලයත්, ජලය ඔහු ගේ ප්‍රයෝජනයට යොද ගන්නා අන්දමත් අතර බැඳී පවතින එකක් වූයේය.

ජලය ලැබෙන ප්‍රමාණය වැස්ස අනුව තීරණය වන එකක්. භූමියට ඇතුළු වන ජලය අනතුරුව එක්කෝ ඇල මාර්ගවලට නැත්නම් භූගත ද්‍රෝණිවලට ගලායනවා. වැස්ස ඇතිවිට පසට උරා ගැනීමට හැකි ප්‍රමාණයට වඩා ඇති අතිරික්ත ජලය කඳු පහලට ගලා යන ජල මාර්ගවලට එක වේ. පස් රඳවා ගැනීමට හැකි ප්‍රමාණයට වඩා වැඩි ජල ප්‍රමාණයක් පසට ඇතුළු වූ විට ඒවායින් සමහරක් උල්පත්, ඇල දෙළ හෝ විල් ලෙස මතු වන අතර, තවත් සමහරක් කලින් සඳහන් කළ පරිදි භූගත ද්‍රෝණිවලට ගලා යනවා. එමනිසා පසට උරා ගැනීමට හා ගබඩා කරගැනීමට උවමනා තරම් යොද ගැනීමෙන්ද වෘක්ෂලතා හා ජලය මතුපිටින් වාෂ්පවීමෙන්ද අනතුරුව ඉතිරි වන වර්ෂා ජලයෙන් කොටසක් පමණයි ඒවා මඟින් නිකුත් කෙරෙන්නේ. එබැවින් ජලය ලැබෙන මූලික මාර්ගය වර්ෂාව යි. උත්ස්වේදනයෙන් හා වාෂ්පීකරනයෙන් වැඩි කොටසක් වායු ගෝලයට උරා ගන්නවා. ජල මාර්ගවලට එකතු වන ඉතිරිය ගංගා, ඇල දෙළ ලෙස ගලා බසිනවා.

## ජලය විනාශකාරී කාරකයක් වශයෙන්: සෝද පාළු වීම.

මිනිසා ජලය පාලනයට නතු කර ගැනිමෙන් අභිමත ඉටු කර ගැනීමටත් ඒ මාර්ගයේ ජයග්‍රහණයන් ලැබීමටත් හැකිවුවත්, තවත් අතකින් ඒවාහි සිදුවූ පසු බැසීම් නිසා ජලයෙන් සිදු වූ විනාශයන්ද දැකිය හැකියි. මෙය ජලය පාලනයට නතු කර ගැනීමට ඉදි කර ඇති ඉදි කිරීම් පද්ධතියේ ජලාශවලත් හා එහි සිට ජලය ගෙන යාමට ඇති ජල මාර්ග ගැනත් නොසැකිලිමත් වීම නිසා සිදුවූ කැඩීම් බිඳීම් හේතුකොටගෙන බාදනයට ගොදුරු වීමත්, එමඟින් සිදුවන රොන් මඩ ආදිය තැන්පත් වීමත් නිසා බොහෝ විට අලාභහානි සිදු වෙනවා. ජලයත් සමඟ ගෙනෙන රොන්, මඩ, පස් ආදිය අපරට ලේ නහර ලෙස සලකන්නට පුළුවන් වාරිමාර්ග හා වැව් අමුණුවලත් ඒ වගේ ම ස්වාභාවික ඇල දෙළවල්වලත් තැන්පත් වීම නිසා ඒවා උතුරා ගොස් බොහෝවිට ගංවතුර තර්ජන ඇති කරනවා. බොහෝ විට මෙය සිදු වන්නේ නෙත් කාල ගුණයක් ඇති විට ලැබෙන අතිරික්ත ජල පාලනයට නතු කර ගෙන, ජලාශවල ඒවා ගබඩා කර, සංරක්ෂණය කර අනුක්‍රමයෙන් ප්‍රයෝජනයට යොද නොගැනීමත් නිසා වන අතර, සංරක්ෂණ කටයුතු නොකිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් වියළි කාලයේ ජල අවශ්‍යතාවයන් පිරිමසා ගැනීමට ඒවායින් ලබා ගත හැකි වන්නේ නැහැ. මේ තර්ජනවලට හේතු වන්නේ කැලෑ නොසැලිකිලිමත් ලෙස හෙලි පෙහෙලි කිරීම, තණ කොළ ආදිය ඉදිරි යන තරමට සතුන් උලා කැවීම, ගිනි තැබීම, සීඝ්‍ර බෑවුම් වල සංරක්ෂණ කටයුතු නොමැතිව වගා කිරීමත් නිසා නියඟයත් මහ වැසිත් වලින් වන බාදන කාරකයන්ට එක එල්ලේ ම පොළව ගොදුරු වීමකුයි. මේ නිසා සෝද පාළුවීම කෘෂිකාර්මික ඉඩම්වල පලදායිතාවය පහළ දැමීමට ද හේතුවක්වේ. ගංවතුර කාල වල සැඩ පහරවල් ලෙස වතුර ගලා බැසීම නිසා දේපලවලට දරුණු අලාභහානි සිදු වන අතර, අනෙක් අතට නියං කාලවල ප්‍රයෝජනයට ගැනීමට ස්වාභාවිකව ජලය රඳවා ගැනීමේ මාර්ග තවදුරටත් නොතිබීම නිසා නියං හානිවලට ද මුහුණ පෑමට ජනතාවට සිදු වන්නේ ය.

වාරිමාර්ග උදෙසා ජලය සහ භූමිය යොද ගැනීම තවත් කරුණක්. විශේෂයෙන් භූමිය, එහි විෂමතාවය, සහ ජලය ගලා බස්නා මාර්ගවල ලක්ෂණ සලකා නොබලා විශේෂයෙන් අයෝග්‍ය අන්දමට උවමනාවට වඩා වාරිමාර්ග ජලය භාවිතා කෙරේ නම් එයින් සිදු වන්නේ යහපතට වඩා අයහපතක් ය. එම නිසා ප්‍රමාණවත් අන්දමට සංරක්ෂණ වැඩ පිළිවෙලක් නොවේ නම් සෝද පාළුව තර්ජනයට රුකුල් දීමක් ඉන් සිදු වේ.

ජලයෙන් සිදු විය හැකි පරිසර දූෂණය තවත් සලකා බැලිය යුතු කරුණක්. පරිසරය දූෂණයවීම ඇතැම්විට ජලයෙන් එක එල්ලේ සිදුවුවද, තවත් විටක අපවිත්‍ර ගෙන යන කාරකයක් වශයෙන් ද පරිසර දූෂණය එයින් සිදුවේ. මෙහි දී එය තීරණය වන්නේ ගොවිතැන් කෙරෙන ඉඩමේ වගා පිළිවෙත් ද ඒ වගේම කර්මාන්තවල අපවිත්‍ර දෑ, නගරවල කැලි කසල පාලන තත්වයන් අනුවත් ය. මෙහි කෘෂි රසායන, පොහොර සෝද යෑම, කර්මාන්ත වලින් ගලා යන දෑ නගරවල අපවිත්‍රත්‍ය. ප්‍රධාන වශයෙන්, ඇතලත් අපවිත්‍රවේ.

සමස්ථයක් වශයෙන් ගත් කළ පරිසරය පිරිහී යාමට තුඩු දෙන අන්දම ඊළඟට සලකා බැලිය හැකි ය. කැලෑ හෙළි කිරීම, ජලය හා පස පිළිබඳ සංරක්ෂණය ක්‍රමයකින් තොරවීම, සැලැස්මකින් තොරව වගා කිරීම නිසා රොන්මඩ තැන්පත් වීම හේතු කොට ගෙන ජල මාර්ග වියළී යෑමට තුඩු දී ස්වාභාවික ගැවසීම් වල වෙනස්කම් සිදු කෙරේ.

එදා අද මෙන් නොව දිය පෝෂක ප්‍රදේශයන්හි පවතින ස්වාභාවික ජල උල්පත් මාර්ග, වනාන්තර හා තෘණ භූමි බඳු ස්වාභාවික වෘක්ෂලතාදියෙනුත්, වගුරු බිම් වල ජලාශයන් හේතු කොට ගෙනත්, ඊට ලැබුණු ආරක්ෂිත ආවරණය හේතු කොට ගෙන ස්වාභාවිකව ගලා බසින දිය පාරවල උතුරා යෑමේ තර්ජන එතරම් භයානක වූයේ නැත. එම වෘක්ෂලතා ආවරණය සහිත පොලවට වැටෙන වැසි ජලය පොලවට උරා ගෙන එය කෙමෙන් මුදවා හරිනු ලබයි. ඒ නිසා ගංගා ජල මාර්ගයන්හි ආරම්භක ප්‍රදේශ ආරක්ෂා වූ අතර, සෝද පාළුවීම එයින් වැලැක් වුනි. එහි ප්‍රතිඵලයක්ව එවකට පැවතියේ ගැඹුරු පැහැදිලි ජලයෙන් යුත් ඇල දෙල ගංගා යි.

ඇත්තවශයෙන් ම ඉඩම් ජනාවාස කරවීම යනාදී කටයුතුවල දී ඉඩම් හෙළි කිරීමත්, ඒ වගේ ම ජලය ගෙන යාමේ වාරිමාර්ග ඇල අමුණු සකස් කිරීමත් කළයුතු වුනත් මෙතෙක් ඇතැම් තන්හිදී ඒවා අවශ්‍ය ප්‍රමාණ ඉක්මවා කටයුතු කිරීම බාදනය හා ගංවතුර පිළිබඳ ප්‍රශ්න උග්‍ර තත්වයක ගෙන යාමට හේතු තිබෙනවා. එමනිසා කෘෂිකාර්මික කටයුතු උදෙසා සිදු කරන ඉඩම් සංවර්ධන කාර්යාවලියේ දී සලකා බැලිය යුතු වැදගත්ම කාරණයක් වන්නේ එම ඉඩම් වගා කටයුතුවලට යොද ගැනීමට කොතරම් සුදුසු ද යන කරුණයි. ඇත්ත වශයෙන් ම නිෂ්පාදන කටයුතුවලට ඉතාමත් සුදුසු ඉඩම් හෙළි පෙහෙලි කර වගා කටයුතුවලට යොද ගැනීම අත්‍යවශ්‍යය යි. අනෙක් අතින් වගා කටයුතුවලට ආන්තික හා උප ආන්තික ඉඩම් ආපසු වනාන්තර හෝ ස්වාභාවික වෘක්ෂලතාදි වලින් ගැවසීමට ඉඩකඩ සැලැස්විය යුතු යි.